**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2016**

--------------------------------------------------------------

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 11(2) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 47 වන ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරන අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කළ යුතු අතර සාධාරණ වටිනාකමෙහි සැළකිය යුතු නොවන තරමේ වෙනස් වීම් පමණක් තිබෙන වත්කම් සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ගිණුමෙහි දැක්වෙන පිරිවැය රු.625,643,071 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එම විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 72 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම අගය කිරීමකින් තොරව පදනම ආරම්භ කරන ලද 2005 වර්ෂයේදී පදනමට පවරා දී තිබුණු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වූ රු. 272,000,000 කින් සියයට 50 ක් ගොඩනැගිලිවල වටිනාකම ලෙස සලකා ක්ෂය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු. 360,962,513 ක් වූ රජයේ ප්‍රදාන යොදා ගනිමින් මිලදීගත් ස්ථාවර වත්කම් වාර්ෂිකව ක්ෂය කරන නමුත් එම ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් පදනම විසින් හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

අන්තර්ජාල සේවා සමාගමක් විසින් ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල 2009 දෙසැම්බර් 16 දින සිට 2013 නොවැම්බර් 01 දින දක්වා කාලය තුල කරන ලද V-SAT ඇන්ටනා නඩත්තු සේවා අවස්ථා 120 කින් 96 ක් සඳහා ගෙවිය යුතු රු.5,415,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

--------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 හා ඊට පෙර වර්ෂවලට අදාලව එවකට පැවති රේඛීය අමාත්‍යාංශයෙන් රු.4,356,341ක මුදලක් පදනම වෙත ප්‍රතිපූරණය කළ යුතු ලෙස දක්වා තිබුණද අදාල රේඛීය අමාත්‍යාංශයේ වාර්තා අනුව එම මුදල ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2016 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ලැබිය යුතු ශේෂය රු. 9,568,353 ක් නිරවුල් නොකල අත්තිකාරම් ශේෂය රු. 17,181,605 ක් සහ ණය හිමි ශේෂය රු. 88,184,387 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථන සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිර්ඝ කාලයක් තිස්සේ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින රු.13,607,208 ක් වු අත්තිකාරම් හා ණයගැති ශේෂ හා රු.10,165,586 ක් වු ණයහිමි ශේෂ පියවීමට/ නිරවුල් කිරීමට පදනම විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 නොවැම්බර් 07 දින පවත්වන ලද පොදු ව්‍යාපාර සඳහා වූ කාරක සභාවේදී ආපසු අයකර ගැනීම අවධාරණය කරන ලද, ලංකා කම්කරු කොංග්‍රසයේ ගොඩනැගිල්ලක පදනම විසින් කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගතයුතු රු.1,890,246 ක් 2017 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පරිගණක දත්ත පද්ධතියක් ඇති කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත 2014 අප්‍රේල් 23 දින රු.541,840 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද, එම කටයුත්ත ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් ලබාදුන් එම අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අදාල රේඛිය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම මත ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්වල දක්වා තිබුණු 2013 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලට අදාලව රු. 6,813,624 ක් 2014 වර්ෂයට අදාලව රු.47,370,427 ක් හා 2015 වර්ෂයට අදාලව රු.3,716,500 ක් 2016 වර්ෂය අවසානය දක්වාම ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

**2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |

(අ) 2005අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත

(i) 3(1) වගන්තිය

2014 වර්ෂයෙන් පසු පදනමේ පරිපාලන කටයුතු සඳහා කළමනාකරණ මණ්ඩලයක් පත්කර නොතිබුණි.

2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන ගැසට් පත්‍රය මඟින් තොණ්ඩමන් අනුස්මරණ පදනමේ කටයුතු කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂනය යටතේ සිදු කරන ලද අතර තොණ්ඩමන් පදනම ලෙස කටයුතු සිදු කරනු නොලබන බවත් එබැවින් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීම අමාත්‍යාංශය මඟින් හෝ වෙන යම් ආකාරයකින් හෝ සිදු කොට නොමැති බවත් මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් සඳහන් කර තිබුණි.

(ii) 10 වගන්තියේ 2,3 හා 4 ඡේද

ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී දරන සියලු වියදම් පදනම විසින් ගොඩනගා ගත් අරමුදලින් දැරිය යුතු වුවත් පදනමේ  මුලු වියදම වූ රු. 102,827,804 ක් සමාලෝචිත වර්ෂයේ රේඛීය අමාත්‍යාංශයෙන් ලබාගෙන පදනමේ කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයතුල පදනම විසින් උපයා තිබුණේ රු.මිලියන 3.35 ක ආදායමක් පමණි.

(ආ) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධිත පනතේ IIකොටසේ 10 (1) හා (2) ඡේද

2012 සැප්තැම්බර් මාසයේ සිට 2013 මාර්තු දක්වා වූ කාලය සඳහා අර්ථ සාධක අරමුදල වෙත ප්‍රේෂනය කල යුතු එකතුව රු.4,205,282 ක් වූ සේවක හා සේවා දායකය සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

මුදල් රෙගුලාසි 757

පදනමේ සියලු අංශ ආවරණය වන පරිදි සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ පදනමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 32,380,913 ක ඌනතාවයක්වූ අතර ඊට අනුරූපීව ඉකුත්වර්ෂයේ ඌනතාවය රු.45,027,660 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,646,747 ක වර්ධනයක් නිරීක්ෂණය විය. තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැටුප් හා වේතන සැපයුම් හා අනෙකුත් පාරිභෝජන වියදම් හා වෙනත් වියදම් රු. 7,248,230 කින් වැඩි වුවද සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.5,687,651 කින් හා ප්‍රජා ශක්ති ව්‍යාපෘතියේ පරිගණක මෘදුකාංග සංවර්ධනය සඳහා වූ ක්‍රම ක්ෂය රු. 13,471,171 කින් අඩුවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ පහක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2012 වර්ෂයේ රු.54,307,157 ක්වූ ඌනතාවය 2016 වර්ෂය වන විට රු.32,431,913 ක් දක්වා අඩුවී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිපලයට සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු. 37,825,404 ක් වූ දායකත්වය අඛන්ඩව වර්ධනය වෙමින් 2016 වර්ෂයේ දී රු.81,671,104 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම රු.මිලියන 54.6 ක් වුවද සමාලෝචිත වර්ෂය තුල කිසිදු ප්‍රාග්ධන ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනමේ කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කර නොතිබුණි. කෙසේ වෙතත් විගණනයට ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තා අනුව ප්‍රජාශක්ති සංවර්ධන වැඩසටහන යටතේ බෝවන රෝග හා පෝෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, ස්වයං රැකියා වැඩමුළු, පරිගණක පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් වැනි ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්ද තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පි (ICTT), ඇලුමිනියම්, වෙල්ඩින්, මෝටර් සයිකල්, විදුලි කාර්මික, ඇඳුම් සැකසීම, ලී වැඩ ශිල්පි හා ඉංග්‍රීසි වැනි මාස 06 හා මාස 12 වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම සහ වෙනත් දැනුවත් කිරීමේ වැඩමුළු හා කඳවුරු 07 ක් පවත්වා තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනම විසින් වතු ප්‍රජාවට සේවය සැලසීම පිණිස පවත්වා ගෙන යනු ලබන ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44 ක අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර තවත් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීමට 2012 වර්ෂයේදී ඉඩම් මැනුම් කටයුතු සිදුකිරීම සඳහා රු. 2,359,298 ක් වැය කරතිබුණ ද, 2016 වර්ෂය අවසානය දක්වාම එම ඉඩම් පදනම වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 10(2) වගන්තිය යටතේ පදනමට පවරාදී තිබුණු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු පිළියෙල කිරීම 2016 දෙසැම්බර් වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් රු. 20,484,000 ක් පදනම වෙත ලබා දී තිබුණු අතර පදනම විසින් ඒ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් 90 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එම නිලධාරීන්ට

ගෙවනු ලබන දිමනා ප්‍රජාශක්ති ව්‍යාපෘතියේ කළමණාකරු හා ව්‍යාපෘති සම්බන්ධිකාරකවරියගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර තිබුණි. එම ක්ෂේත්‍ර සම්බන්ධිකාරක කළමණාකරු හා ව්‍යාපෘති සම්බන්ධිකාරක විසින් ව්‍යාජ නම් ඉදිරිපත් කරමින් එම මුදලින් රු. 4,252,500 ක් වංචා සහගත ලෙස ලබා ගෙන තිබුණු බව 2011 අප්‍රේල් සිට 2013 අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය සඳහා සිදු කරන ලද විමර්ෂනයක් අනුව අනාවරණය වී තිබුණි. ඒ අනුව එකී නිලධාරින් විසින් එම මුදල් ආපසු ගෙවීමට එකඟ වී 2014 මැයි 25 වන දින වන විට ඉන් රු.1,050,000 ක් ගෙවා තිබුණ ද ඉතිරි රු. 3,202,500 ක මුදල 2017 වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි. එසේම 2010 වර්ෂයේ සිට 2011 මාර්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශය විසින් පදනම වෙත ලබා දී තිබූ රු.5,265,000 ක් වූ ක්ෂේත්‍ර සම්බන්ධිකාරක දිමනා ඉහත පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කර තිබීමට අදාලව පදනම විසින් විමර්ෂණයක් පවත්වා නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ වටිනාකම රු. 72,818,294 ක්වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 09 ක් 2010, 2011 හා 2012 වර්ෂවලදී ආරම්භ කර පසුව අතරමග නවතා දමා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනත් මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු. 25,675,995 ක් වූ මෙම නොනිමි වැඩ 2017 වර්ෂය අවසානය දක්වාම නිම කිරීමට පදනම අපොහොසත් වී තිබුණි. අදාල ඉදිකිරීම් සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් කොන්ත්‍රාත්කරුවකුට රු. 7,544,265 ක් 2012 වර්ෂයේ දි ගෙවා තිබුණ ද ඔහු විසින් නිම කල ඉදිකිරීම් කටයුතු සඳහා ඔහුට ගෙවිය යුතු රු.1,985,942 ක් 2012 වර්ෂයේ සිට ගිණුම්වලින් ඉදිරියට ගෙන එමින් පවතුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ගිවිසුමකට එළඹීමෙන් තොරව පරිගණක මිලදී ගැනීම හා V-SAT ඇන්ටනා නඩත්තු සේවාව ලබා ගැනීම සඳහා 2009 සැප්තැම්බර් සිට 2014 මාර්තු දක්වා කාලය තුල රු.51,099,464 ක මුදලක් පෞද්ගලික සේවා ආයතනයකට ගෙවා තිබුණි.

## 4.4 නිශ්ක්‍රීය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතයෙන් ඉවත් කරන ලද සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ පිරිවැය රු. 5,396,901 ක් වූ යතුරුපැදි 57 ක් විකිණීමට හෝ ඉවත්කිරීමට කටයුතු නොකර විගණිත දිනය වූ 2017 නොවැම්බර් 30 දින දක්වා නිශ්කාර්යව පැවතුණි.

(ආ) ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ ( Self Employment Loan Project) ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දීම සඳහා 2014 දෙසැම්බර් 01 දින රු. 4,048,000 කට මිලදී ගෙන තිබුණු සිමෙන්ති බ්ලොක්ගල් මැෂින් 44 ක් 2015 පෙබරවාරි 24 දින නිකුත් කරන ලද අධිකරණ නියෝගයක් හේතුවෙන් අදාල ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දීමට නොහැකිව තිබුණු අතර 2017 දෙසැම්බර් වන විටද නෝවුඩ් තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයේ නිශ්කාර්යව ගබඩා කර තිබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් බෙදා දීම සඳහා 2014 වර්ෂයේ දි ණය පදනම යටතේ මිලදී ගෙන තිබුණු රු. 1,070,848 ක් වටිනා කෝවිල් සීනු 15 ක් හා පිත්තල පූජා පහන් කට්ටල 377 ක් ද රු. 350,000 ක් වටිනා කායවර්ධන උපකරණ කට්ටල 07 ද, රු. 1,373, 520 ක් වටිනා ක්‍රිඩා උපකරණ කට්ටල 194 ක් ද , එම ක්‍රීඩා සංකීර්ණයේම නිශ්කාර්යව පවතින බව විගණනයට වාර්තා වි තිබුණි.

2014 වර්ෂය අවසානයේදි මිලදි ගත් මෙම උපකරණ 2015 ජනවාරි මස ජනාධිපතිවරණයෙන් පසුව උසාවි නියෝගයක් අනුව බෙදා හැරිම නවතා දමා තිබුණද 2018 ජූලි 12 දින වන විට කෝවිල් සීනු 07 ක් සහ පිත්තල පූජා භාණ්ඩ 68 ක් කෝවිල්වලට බෙදා දී තිබුණු අතර කායවර්ධන උපකරණ 07 එම ක්‍රිඩාංගනයේ පවතින කායවර්ධන මධ්‍යස්ථානයේ භාවිතයට ගෙන තිබුණි. ක්‍රිඩා උපකරණ කට්ටල වලින් බෙදා හැරිය හැකි සියල්ල බෙදාහැර ඇති අතර ඇතැම් ක්‍රිඩා භාණ්ඩ දිරා පත් වි ඇති බැවින් භාවිතයට නුසුදුසු තත්ත්වයෙන් පවතින බව මීට පිලිතුරු වශයෙන් පදනමේ අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් සදහන් කර තිබුණි.

(ඈ) 2007, 2008 හා 2009 වර්ෂවලදී ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 කට අන්තර්ජාල සේවා සැපයීම, ඒ සඳහා උපදේශන ගාස්තු ගෙවීම, V-SAT ඇන්ටනා උපකරණ කට්ටල 42 ක් මිලදී ගැනීම හා එම උපකරණ නඩත්තු හා අලුත්වැඩියා කිරීම සඳහා රු.131,404,288 ක් වැයකර තිබුණ ද 2014 මාර්තු 01 දින සිට එම අන්තර්ජාල සේවාව ලබා ගැනීම නවතා දැමීම හේතුවෙන් එම ඇන්ටනා උපකරණ කට්ටල 42 ක් විගණිත දිනය වූ 2017 වර්ෂය අවසානය දක්වා නිශ්ක්‍රීයව පැවතුණි. තවද එම සේවාව නවතා දැමීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා ඇති පිරිවැය රු. 398,999 ක් වූ සමරු පළඳනා තොගයක් දීර්ඝ කාලයක සිට අදාල පාර්ශවයන් වෙත නිකුත් නොකර නිශ්කාර්යව පැවතුණි.

**4.5 හඳුනාගත් පාඩු**

2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ අංක 150 ට පටහැනිව සහ අදාල රේඛිය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා WPPF 7268 දරන මිට්ෂුබිසි ඩබල් කැබ් රථය රු.1,000,000 ක මූලික ගෙවීමක් සහ මාසික වාරික 60 කින් ගෙවීමේ පදනම මත රු.5,840,000 කට 2014 නොවැම්බර් 26 දින කල්බදු ක්‍රමය යටතේ පෞද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. නියමිත පරිදි කල්බදු වාරික නොගෙවීම හේතුවෙන් අදාල කැබ් රථය කල්බදුකරු විසින් නැවත අත්පත් කරගෙන තිබුණු අතර 2015 නොවැම්බර් 30 දින වනවිට වාහනයේ අයිතියද කල්බදුකරු විසින් පවරාගෙන තිබුණි. කෙසේවුවද මෙම වාහනය සඳහා කරන ලද මූලික ගෙවීම් රු.1,070,290 ක් හා කල්බදු වාරික රු.495,214 ක් වශයෙන් එකතුව රු.1,565,504 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ලෙස ගිණුම්වල දක්වා තිබුණු අතර එම මුදල් අය කර ගැනිමේ හැකියාව පිළිබඳව කළමණාකරණය අවධානය යොමු කර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රධාන කාර්යාලයේ හා අනුමත ව්‍යාපෘති 03 ක 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 218 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 130ක් වූයෙන් පුරප්පාඩු 88 ක් වු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා කාර්යය මණ්ඩලය හා වැටුප් ප්‍රමාණ අනුමත කරගෙන නොතිබුණ ද 2016 දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපෘතියේ තත්‍ය කාර්ය මණ්ඩලය 33 ක් විය.

(ආ) ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී තනතුර ඇතුළුව තනතුරු 06ක් දිගුකාලයක සිට පුරප්පාඩුව පැවතුණි. 2005 වර්ෂයේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) තනතුර සඳහා ස්ථිර පුද්ගලයකු පත් නොකර වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඇ) නෝවුඩ් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා 2003 වර්ෂයේදී තනතුරු 21 ක කාර්යමණ්ඩලයක් අනුමතකර තිබුණ ද එහි ක්‍රීඩා පුහුණු කිරීමේ කටයුතු සැලසුම් කල පරිදි ක්‍රියාත්මක නොවන බැවින් නිලධාරීන් දෙදෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි.

(ඈ) 2013 වර්ෂයේදී පදනම විසින් රු.150,000 ක් වැයකර බාහිර උපදේශකයෙකු වෙතින් සකස් කරවා ගත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටිය 2016 වර්ෂය අවසානය වන විටත් අනුමත කරවාගෙන නොතිබුණි. වර්තමානය වන විට පදනමේ ව්‍යාපෘති අදාල රේඛිය අමාත්‍යාංශය විසින් පවරා ගෙන ක්‍රියාත්මක කරන බැවින් එම වියදම නිශ්කාර්ය වියදමක් ලෙස විගණනයේ දි නිරීක්ෂනය විය.

(ඉ) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර තිබූ සංස්කෘතික නිලධාරී තනතුර සඳහා 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිලධාරියකු පත් කර නොතිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන සම්බන්ධිකරණ හා පාලිකා (Warden) යන තනතුරු 2 කට අදාල නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන ඔවුන්ට සමාලෝචිත වර්ෂය තුල රු.832,180 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පදනම විසින් 2016 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 15 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඞී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම පිළිබඳ සහතිකය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. තවද 2014 වර්ෂයේ සිට පදනම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණු අතර පදනම විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති 04 හි සියළුම කාර්යයන් 2016 ජුලි 20 දිනැති ජනාධිපති කාර්යාලයේ CSA/1/31 දිනැති ලිපියට අනුව කඳුරට නව ගම්මාන හා වතු යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු අතර එම අමාත්‍යාංශයේ ලේකම්වරිය විසින් විගණනය සඳහා ගිණුම් ඉදිරිපත් කරන ලදී.

### 5.2 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 හා 2011 දෙසැම්බර් 23 දිනැති පිළිවෙලින් අංක DMA/2009(1) හා DMA/ADM/2011/1/26 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමුකර කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ව්‍යුහයක් ඇතිකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රයෝජනයට ගත යුතු වුවත් අභ්‍යන්තර විගණක විසින් පුරප්පාඩුව තිබූ ගණකාධිකාරි තනතුරේ කාර්යයන් සිදු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

පදනම සඳහා සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් අනුමැතියලත් අයවැය ලේඛනයක් නොතිබුණු අතර කෙටුම්පත් අයවැය ලේඛනයක් පමණක් පිළියෙල කර තිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් පදනම ආරම්භකළ 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම වාර්ෂික වාර්ථා සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | | |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පරිපාලනය | - ගිවිසුම් ගත පරිදි කොන්ත්‍රාත් නිම නොකිරීම |
| (ආ) | මූල්‍ය පාලනය | - ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම |
| (ඇ) | වත්කම් කළමනාකරණය | - වත්කම් නිශ්කාර්යව පැවතීම. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | - අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |